


# දිරිය දියණිය හංසමාලාට අතදෙන්න

ලාල් ප්‍රේමතුංග



දරුවන් ලොවට සම්පතකි. දරුවන්ගේ සිත් අහිංසකය, සැහැල්ලුය, ක්‍රෝධය ඊර්ෂියාව දරුවන් තුළ නැත. එනිසාම දරුවන්ගේ ලෝකය සුන්දර වන්නේය.

වාසනා අංජුලා හංසමාලිද නිරෝගීව මෙලොව එළිය දුටු ළමා ලොව සුන්දර කළ දැරියකි. ඇය කුඩා කල අනෙකුත් දැරියන් මෙන් දුව පැන ඇවිද සිනාසුණෝ කාගෙත් සිත් සතුටු කරමිනි. නමුත් දෛවය ඇයගේ මෙන්ම දෙමාපියන්ගේ ද සතුට උදුරා ගත්තේ කිසිවකු නොසිතු ලෙසිනි.

අංජුලා වෙනදා පාසල් ගිය රථය එදින නිවස අසලට පැමිණියේ නැත. එබැවින් ඇය මවත් සමග පාසල් යන්නට සූදානම්ව මවගේ අතේ එල්ලීගෙන පාර අසල සිටියේ බස්රථයක් එනතුරුය. අකාරුණික බස් රියදුරෙකුගේ නොසැලකිල්ල නිසාම අංජුලාත් ඇයගේ මවත් බස්රථයට යටවන්නාහ. දෑසට කඳුළ නැගෙන හද රිදුම් දෙන මේ දැරියගේ කතා පුවත ඇරඹෙන්නේ මෙතැන් සිටය.

මේ අනතුර සිදුවූයේ 2008 සැප්තැම්බර් 18 දින මාවනැල්ලේ දීය. එවිට ඇයට අවුරුදු 07 කි. මාවනැල්ල උඩුබද්දාවල බැද්දවෙල කනිෂ්ඨ විදුහලේ 2 වැනි ශ්‍රේණියේ ඉගෙනුම ලබද්දීය. අනතුරින් පසු සිහිඑළැඹෙන විට ඇයත් මවත් සිටියේ මාවනැල්ල රෝහලේ ඇඳක් මතය.

මව වූ සමන්ලතා ඉක්මන් සුවයක් ලැබුවාය. අංජුලාගේ බාහිර තුවාල දකින්ට නොලැබිණි.

එහෙත් ඇයගේ ඉනෙන් පහළ දරුණු ලෙස තැලීම්වලට ලක්ව තිබිණි. ඒ හේතුවෙන්ම ඇයගේ සුසුම්නාවටද දැඩි ලෙස හානි සිදුවී තිබිණි. එතැන් පටන් ඇයට දැනුනේ ඉනෙන් පහල නැති අයුරකි.

ඇයට කෙළින් නැගී සිටින්නට නොහැකිවිණි. මළ මුත්‍රා පිටවීම පවා ඇයට නොදැණිනි. ඉඟපෙදෙසින් පහළට හැඟීම් දැනීම් කිසිවක් ඇයට දැනුනේ නැත. එතැන් පටන් ඇයගේ සමනල වියේ දඟකාරකම් නැවතිණි. රෝද පුටුවක සිට ජීවිතයේ දුක, කඳුළුඑජ්සුසුම සමග තනිව හිඳින්නට සිදුවූවාය.

පියා කළ කුලී රැකියාවෙන් දිවි ගෙවමින් ඔවුන් සිටියේ බොහෝ කම්කටොලු මැදය. එනිසා ජීවන බරින් තැලෙමින් සිටි ඔවුන් තම දරුවාට වූ මේ විපතින් අංජුලාගේ මවගේ හිස තව තවත් ගිනි ගත්තාය.

කිසිදිනක මෙවැනි විපතක් සිදුවේ යෑයි සිහිනෙකදු නොසිතූ නොපැතූ ලෙස දෛවය සියල්ලගේම හදකම්පා කරවමින් මේ දියණියගේ දෙපා අඩපණ කර දැමුවාය. ඉන් පසු ඇවිදින්නට නොහැකිව දෙකකුල් අප්‍රාණික විය. දින ගණනකදී ඇය මහනුවර රෝහලටත් එතැනින් කොළඹ ජාතික රෝහලටත් ප්‍රතිකාර සඳහා ගෙන එනු ලැබීය. එහෙත් හංසමාලි දියණිය නැගිටුවන්නට වෛද්‍යවරු අසමත් වූහ.

එහෙත් ඒ වෛද්‍යවරු කිවූ පරිදි හංසමාලිගේ සුසුම්නාව තුළ තැලී ගිය ලේ කැටියක් සිරවී තිබිණි. එය ඉන්දියාවේ පහසුකම් සහිත රෝහලකදී සැත්කමකි න් ඉවත් කිරීමට හැකියාව ඇති බවද වෛද්‍යවරුන්ගේ අදහස විය. එහෙත් ඒ සඳහා රුපියල් ලක්ෂ 15 ක පමණ මුදලක් වැය වන බවද ඔව්හු කීහ. අංජුලාට වැසිකිළි කැසිකිළි යැමට කැතීටරයක් සවිකිරීමට සිදුවූ අතර මාසිකව ප්‍රතිකාර සඳහා සායන වලට යැමටද සිදුවිය. ඉනෙන් පහළ හැඟීම්, දැනීම් නොදැනීම හේතුවෙන් සියලූ පවිත්‍රතා කටයුතු සිදු කළේ මවගේ දෑතිනි.

ප්‍රතිකාර ලබමින් කාලය අවුරුදු එකහමාරක් පමණ ගෙවිණි. ලක්ෂ පහළොවක් සොයාගැනීමට දැරූ වෙර වෑයමට ඉතිරි වූයේ කඳුළුත් දහදියත් පමණි. එම මුදල සෙවීම සිහිනයක් සේ හැඟී ගියෙන් ඔව්හු එය පසෙකලා නතරව ගිය දියණියගේ පාසල් ගමන රෝදපුටුවක හිඳුවා යළි ආරම්භ කරන්නට කටයුතු කළහ.

හංසමාලි දැරිය අඳුරු දෛවය පරදා ජීවිතය ගොඩ නැඟීමට වෙර දරන දිරිය දියණියකි. වසර එකහමාරක් පමණ ඇයට පාසල් යන්නට නොහැකි විය. ඇය රෝද පුටුවෙන් පාසල් ගොස් 2011 දී ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 175 ලබා සමත්ව තමන්ගේ දක්ෂතාව පෙන්නුම් කළාය. තම මව නොවන්නට ඇයගේ පාසල් ගමන කෙළවර වනු නියතය.

අඟහිඟකම් හතරවටින් ගලා එන විට අංජුලාගේ පියා ඔවුන් මගහැර ගියේ හිත්පිත් නොමැත්තකු ලෙසිනි. එහෙත් අංජුලාගේ මව තම නෙත්දෙක වන් දරු දෙදෙනා ගඟට තල්ලූ කරන්නට සිතුවේ නැත. ඔවුන්ට වස පෙව්වේ ද නැත. දරුවන් ඇදගෙන දුම්රියට පනි න්නට ගියේ ද නැත. ඇය දරුවන් රැකගත හැකි මගක් සොයමින් දස අත ඇවිද ගියාය.

අංජුලා ශිෂ්‍යත්වය සමත්වීමත් සමගම ඇය ඉගෙනුමට දක්ෂතාව පෙන්වූයෙන් ඇය ගම්පහ රත්නාවලී බාලිකාවට ඇතුළත්කර දරුවන් දෙදෙනා සමග පදිංචියට කුලියට කාමරයක් සොයා ගන්නට සමන්ලතාට සිදුවිණි. දියණිය සුවපත් කළ හැකි වෛද්‍යවරයකු සිටිතැයි ඇය තුළ දැඩි විශ්වාසයක් ගොඩ නැගී තිබිණි.

නැඟණිය තරුෂි චන්දනා ද මේ වන විට 4 වැනි පන්තියේ ඉගෙනුම ලබන්නීය. ඇයටද වයස අවු( 09 කි. ඔවුන් අනේක විධ දුක් කම්කටොලූ විඳිමින් දුෂ්කරදිවියක් ගත කරන්නාහ. මේ වන විට ප්‍රදේශයේ හිතවතුන්, සහ රත්නාවලී බාලිකාවේ දෙමාපිය සහ ආචාර්ය මණ්ඩලයේ නොමඳ උදව් උපකාර මැද ඔවුන් තිදෙනා කාලය ගත කරන්නේ ඒ කුලී කාමරය තුළය.

රෝහල් යැමට, නියමිත බෙහෙත් හේත් ගැනීමට, දරු දෙදෙනාගේ ඉගෙනීමට, කාමර කුලිය, කෑම බීම වෙනුවෙන් වැය කළ යුතු මුදල කොතෙක්දැයි මේ මව ගෙන් ඇසිය යුතු නැත. ඇයට රැකියාවකට ගොස් මේ දරුවන් රැකගන්නට තිබෙන එකම මඟත් ඇහිරී ඇත්තේ ඉන්න හිටින්නට හරිහමන් තැනක් නැති හේතුවෙනි. අද වන විට හංසමාලි දියණියටත් සමන්ලතාටත් සැනසුම් සුසුමක් හෙළිය හැකි එක් කඩඉමක් ඉතිරිව තිබේ.

ගාල්ල කරාපිටිය රෝහලේ විශේෂඥ වෛද්‍ය දීපාල් අත්තනායක මහතා මේ දියණියගේ සැත්කම කරාපිටිය රෝහලේදී තමන්ට කළ හැකි බව පැවසීම හේතුවෙනි. එයින් කිසියම් සුවයක් ලැබිය හැකි මඟක් පළවෙනු ඇතැයි ද ඔහු විශ්වාසය පළ කර තිබේ. එම සැත්කම 2015 වසර තුළ කළ හැකි බව ද කියවෙයි. සැත්කම සංකීර්ණය, කළ යුතු වෛද්‍ය පරීක්ෂණ බොහෝය. දැනට නොලැබී ඇති ශාරීරික වර්ධනය නිසි පෝෂණයකින් ඇයට ලබාදී සැත්කමට සූදානම් කළ යුතුය. එසේ නොවන්නේ නම් සැත්කමේ කාලය දිගු විය හැකිය.

මේ සැත්කම හා ප්‍රතිකාර සඳහා වියදම නිශ්චිතව කිව නොහැකි වුවත් ලක්ෂ 10 ක පමණ මුදලක් වැයවෙනු ඇතැයි දියණියගේ මව පැවසුවාය. මේ මුදල සෙවීම අසීරු කටයුත්තකි.

සැමියකු නොමැතිව ඉන්නට හිටින්නට තැනක් නොමැතිව ගැහැනු දරුවන් දෙදෙනකු සමග කිසිවකුගේවත් හවිහරණක් නැතිව අසරණව සිටින්නේ නම් එම ඉරණමේ දුක්**ඛි**ත බව වචනවලට පෙරළිය නොහැකිය.

මේ සිදුවීම් පෙළ අතර ඇය වෙතින් එළනොවූ නොපෙනෙන දුක්බර කතා පෙළක් දම් වැලක්සේ ඇමිණී තිබේ. කෙසේ වුවද මේ ජීවිතවලටද බඩගින්න සොයා එන්නේය. බඩගින්න ලැව්ගින්නට වැඩි ගින්දරකි. කෙටියෙන් පවසන්නේ නම් මොවුන් මහපාරට වැටෙන දිනය පෙනෙන මානයේය.

දුක වේදනාව, කඳුළ සුසුම හඳුනන සංවේදී හිත් ඇති උතුම් මනුෂ්‍යයන් ඕනෑ තරම් අප අතර සිටිති. මේ එවැනි ගුණවතුන්ගේ දැන ගැනීම සඳහාය. ගම්පහ මහජන බැංකුවේ ගිණුම් අංකය 026-2-001-4-0017162. ඇය වෙනුවෙන් විවෘතය. වැඩි විස්තර 0723370145 දුරකථන අංකයෙන් දැනගත හැකිය.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර www.thisara.com